**උඩුදුම්බර ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගබඩා ද්‍රව්‍ය මිල දී ගැනීම් හා නිකුත් කිරීම් සඳහා ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කිරීමකින් තොරව වර්ෂය අවසානයේ රු.625,935 ක තොග ශේෂය ගබඩා අත්තිකාරම් ගිණුමට බැර කර ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ආ) ඉඩම් හා ගොඩනැගිලි යටතේ අම්බලම් ලෙස රු.775,000 ක වටිනාකමක් ගිණුම්ගත කර ඇතත්, ඉන් බොහෝමයක් ගරා වැටී තිබුණි. රු.200,000 ක් වටිනා අම්බලම් 03 ක් විනාශ වී තිබුණු අතර, එම අගයන් ඉඩම් හා ගොඩනැගිලි යටතේ තවදුරටත් දක්වා තිබුණි.

(ඇ) අංක CPRX – 2565 දරන ජල බවුසරයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 ලැබියයුතු ගිණුම්.

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 08 ක එකතු වටිනාකම රු.16,387,845 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්ම වූ ශේෂයන්ගේ එකතුව රු.11,541,857 ක් විය.

### 1.3.3 ගෙවියයුතු ගිණුම්.

ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ 04 ක එකතුව රු.15,148,401 ක් වූ අතර, එම ශේෂය තුළ ඇතුළත් කර්මාන්ත ණයහිමි වටිනාකම රු.14,728,980 ක් විය. මෙම ණය ශේෂයන්ගෙන් අවුරුදු 01 ක කාලයක් ඉක්ම වූ ශේෂයන්ගේ එකතුව රු.11,588,417 ක් විය.

| ආදායම් විෂයය | 2015.01.01 ට හිගය | වර්ෂයේ බිල් කළ ආදායම | 2015 වර්ෂයේ එකතු කිරීම්/ දඩ මුදල් | දුන් වට්ටම් සහ හිලව් කිරීම් | එකතු කළ ආදායම | | මුළු අය කලයුතු ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 2015 .01.01 දිනට හිගයෙන් එකතු කළ ආදායම | 2015 වර්ෂයේ බිල් කළ ආදායමෙන් එකතු කළ ආදායම | |
| | රු. | රු. | | | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 330,815 | 634,174 | 30,100 | 21,928 | 65,245 | 427,817 | 480,099 |
| බදු කුළී | 414,905 | 517,200 | 25,970 | | 380,685 | 365,910 | 211,480 |
| බලපත්‍ර ගාස්තු | 30,000 | 645,950 | | | 30,000 | 645,950 | -- |
| වෙනත් ආදායම් | 3,544,633 | 4,046,706 | 108,525 | 61,080 | 1,671,769 | 2,239,041 | 3,727,974 |
| එකතුව | | | | | | | 4,419,553 |

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

ගිණුම් විෂයයන් 06 කට අදාළව ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරිම හේතුවෙන්, එකතුව රු.13,220,097 ක් වූ ගනුදෙනු සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය/ සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,973,207 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,380,427 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලය රු.3,353,634 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 ආදායම් පරිපාලනය.

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබද තොරතුරු පහත දැක්වේ.

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.4,419,553 ක ශේෂයක් හිග හිට පැවතුණි.

### 2.2.2 වරිපනම් බදු

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට හිග වරිපනම් ශේෂය රු.141,500 ක් වූ අතර, ඉන් වර්ෂය තුළ රැස් කර තිබුණේ සියයට 46 ක් වූ රු.64,833 ක් පමණි. 2015 දෙසැම්බර් 31 දිනට හිගය රු.279,764 ක් වූ අතර, එම ශේෂයෙන් වර්ෂයක් ඉක්ම වූ හිග ශේෂය රු.141,500 ක් වී තිබුණි. මෙයින් තවදුරටත් අය විය යුතු හිගය රු.197,892 ක් බව ලේකම්වරයා 2016 ජූලි 04 මා වෙත වාර්තා කර තිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 33 සිට 42 දක්වා වූ විධිවිධාන අනුව හිඟ වරිපනම් බදු අය කිරීමට පියවර ගෙන නොතිබුණි.

### 2.2.3 බදු කුළී.

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.414,905 ක කඩ කාමර කුළී ශේෂයක් පැවති අතර, ඉන් රු.380,685 ක් අය කර ගෙන තිබුණි. වර්ෂයේ බිල් කළ වටිනාකම වූ රු.517,200 ක මුදලින් ලැබී තිබුණේ රු.365,910 ක් පමණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.211,480 ක් අය වියයුතුව පැවති අතර, එම ශේෂයෙන් 2016 ජූනි 30 දින වන විට රු.21,830 ක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

### 2.2.4 බලපත්‍ර ගාස්තු.

2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පවතින ලද රෙගුලාසිවලට අනුකූලව 2008 ජනවාරි 25 දිනැති අංක 1523 / 16 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව සභාව විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කළයුතු වුවත්, බල ප්‍රදේශයේ පැවති දුම්කොළ වියළීමේ කර්මාන්ත හා වී ඇඹරුම්හල් ඇතුළුව කර්මාන්ත 56 කට අදාළ බලපත්‍ර නිකුත් කර නොතිබූ අතර, ඒ හේතුවෙන්, සභාවට රු.168,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

### 2.2.5 වෙනත් ආදායම්.

**(අ) අක්කර බදු.**

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.189,315 ක හිග ශේෂයක් පැවති අතර, වර්ෂයට අදාළව රු.11,906 ක් බිල් කර තිබුණි. ඉන් වර්ෂය තුළ රු.1,444 ක් ලැබී තිබූ අතර, එය බිල් කිරීමෙන් සියයට 12 ක තරම් අඩු මට්ටමක පැවතිණි. සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිග හිටි අක්කර බදු ශේෂය රු.200,334 ක් වී තිබුණි. මෙම ශේෂයෙන් 2016 ජූනි 30 දිනට රු.94,807 ක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

**(ආ) ජල ගාස්තු.**

(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිග ජල ගාස්තු රු.1,030,069 ක් වූ අතර, ඉන් රු.547,556 ක් වර්ෂය තුළ අය කර ගෙන තිබුණි. වර්ෂයේ බිල් කිරීම් රු.774,508 ක් වූ අතර, ඉන්

රු.337,798 ක් ද, අය වී තිබුණි. වර්ෂය අවසාන දිනට හිග ශේෂය රු.919,103 ක් වී තිබුණි. මෙම ශේෂයෙන් 2016 ජූනි 30 දිනට රු.447,883 ක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

(ii) සභාව මගින් ජල ව්‍යාපෘති 03 ක් යටතේ ජල සැපයුම් සම්බන්ධතා 514 ක් ලබා දී තිබූ අතර, ඉන් 410 ක්ම ජල මනු රහිත සම්බන්ධතා විය. ජල මනු රහිතව ජල සම්බන්ධතා ලබා දීමෙන් ජල භාවිතය නිශ්චිතව මැන ගත නොහැකිවී හේතුවෙන්, සැළකියයුතු ආදායමක් සභාවට අහිමි වීමේ ඉඩකඩ පැවතුණි.

**(ඇ) කුළී රථ හා ත්‍රීරෝද රථ ගාස්තු.**

සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ හිග ශේෂය රු.259,100 ක් වූ අතර, ඉන් වර්ෂය තුළ රැස් කර තිබුණේ සියයට 06 ක් වූ රු.16,100 ක් පමණි. සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම රු.241,200 ක් වූ අතර, ඉන් රැස් කර තිබුණේ සියයට 19 ක් වූ රු.45,900 ක් පමණි. 2015 දෙසැම්බර් 31 දිනට හිගය රු.438,300 ක් විය. මෙම ශේෂයෙන් 2016 ජූනි 30 දිනට රු.80,700 ක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.147,254 ක් හා මුද්දර ගාස්තු රු.2,145,660 ක් ලැබියයුතුව පැවතුණි. ලැබියයුතු මුද්දර ගාස්තු 2016 ජූනි 30 දිනට රු.1,982,974 ක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී නොතිබීම නිසා, පරිසර ආරක්ෂණ බලපත්‍රවලින් බදු ලෙස රු.121,281 ක් උපයා ගෙන එම මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු නොකර, තැන්පතු ලෙස රඳවා ගෙන තිබුණි.

(ආ) වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් සහිත බහු කාර්යය ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කිරීමකින් තොරව 2014 ජූලි 25 සිට 2016 ජූලි 24 දක්වා කාලය සඳහා මසකට රු.43,500ක් බැගින් රු.1,044,000 කට ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රාදේශිය විදුලි කාර්යාලයක් සඳහා බදු දී තිබුණි. මේ සඳහා නොතාරිස් ගාස්තු ලෙස රු.31,320 ක් ද ගෙවා තිබුණි.

(ඇ) සභාවේ පුරප්පාඩු තනතුරු 18 ක් සහ අතිරික්ත තනතුරු 02 ක් පැවතිණි.

(ඈ) වාණිජ අරමුණු මත මිල දී ගෙන සේවයේ යොදවා තිබූ ඩුප්ලෝ මුද්‍රණ යන්ත්‍රය සඳහා වාර්ෂික ආදායම් හා වියදම් ගිණුමක් හා සමුච්චිත පිරිවැය ප්‍රතිලාභ දැක්වෙන ප්‍රකාශයක් පිළියෙළ කිරීමට කටයුතු කර නොතිබූ අතර, මුද්‍රණ යන්ත්‍රය සේවයේ යෙදවීම වෙනුවෙන් වැය වූ ලිපිද්‍රව්‍ය වියදම් යන්ත්‍ර නඩත්තු හා සේවක වැටුප් සමග ආදායම් සැසඳීමේ දී වර්ෂය තුළ රු.155,526 ක මුල්‍ය අලාභයක් ලබා තිබුණි. පළාත් පාලන ආයතන හා වෙනත් රජයේ ආයතන 10 කට මුද්‍රණ කටයුතු

කර දීමෙන් ලැබිය යුතු රු.90,425ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයෙන් 2016 ජූනි 30 දිනට රු.30,000 ක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ පවතින සියලුම ව්‍යාපාර ආයතනවලින් වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණු අතර, නියැදියක් ලෙස හුන්නස්ගිරිය සිට මීමුරේ දක්වා දිවෙන මාර්ගය හා අවට පවත්වා ගෙන යනු ලබන නිවාඩු නිකේතන 03 කින් හා විදුලිබලාගාරයකින් බදු හෝ ගාස්තු අය කර නොතිබූ බව 2015 නොවැම්බර් 18 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) හුන්නස්ගිරිය සිට මීමුරේ දක්වා මාර්ගය නියැදියක් ලෙස කළ පරීක්ෂාවේ දී අනවසර ඉදි කිරීම් 06 ක් අනාවරණය වූ අතර, මේ පිළිබඳ සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය.**

---------------------------

**3.3.1 කලල්ගමුව ප්‍රජා ශාලාව ඉදිකිරීම**

---------------------------------------

දින 100 විශේෂ සංවර්ධන වැඩසටහනට සමගාමීව ගම් නගා සිටුවීමේ වැඩසටහන යටතේ කලල්ගමුව නව ප්‍රජා ශාලාව ඉදිකිරීම සඳහා 2015 දෙසැම්බර් 20 වැඩ අවසන් කර රු.980,000 ක් වැය කර තිබුණි. ගොඩනැගිල්ලේ බිත්ති බැඳ කොන්ක්‍රීට් වහලය පමණක් සකසා තිබුණු නමුත්, ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීමට සුදුසු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. මේ නිසා, ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට නොහැකිව 2016 මැයි 13 දින වන විටත් වල් බිහි වීමට ඉඩ හැර තිබුණි.

**3.3.2 මඩුගල්ල නව ප්‍රජා ශාලාවක් ඉදිකිරීම**

---------------------------------------

දින 100 විශේෂ සංවර්ධන වැඩසටහනට සමගාමීව ගම් නගා සිටුවීමේ වැඩසටහන යටතේ මඩුගල්ල නව ප්‍රජා ශාලාව ඉදි කිරීම සඳහා රු.757,361 ක් වැය කර තිබුණි. ගිවිසුම්ගත වැඩ විෂයයන්වලට අනුව ගොඩනැගිල්ලේ බිත්ති බැඳ කොන්ක්‍රීට් වහලය පමණක් සකසා තිබුණු නමුත්, ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීමට සුදුසු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. මේ නිසා, රු.757,361 ක් වැය කර ඉදි කළ ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට නොහැකිව 2016 මැයි 13 දින වන විට වල් බිහි වී තිබුණි.

**3.3.3 මඩුගල්ල දකුණ හා කෙවුල්ගම පාර ප්‍රතිසංස්කරණය කිරිම**

---------------------------------------------------------

දින 100 විශේෂ සංවර්ධන වැඩසටහනට සමගාමීව ගම් නගා සිටුවීමේ වැඩසටහනට අනුව රු.490,000ක ඇස්තමේන්තු මුදලකට මඩුගල්ල දිවි නැඟුම ප්‍රජා මූල සංවිධානයට පවරා වැඩ නිම කිරීමෙන් පසුව රු.441,000 ක් ගෙවා තිබුණි. වැඩ විෂයය අංක 03 යටතේ 1:2:4(3/4 ) සිමෙන්ති, වැලි හා ගල් මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් කිරීමට ඇස්තමේන්තු කර තිබූ මාර්ග තලය 2016 මැයි 17 දින ස්ථාන කිහිපයක් කඩා පරීක්ෂා කිරීමේ දී ශක්තිමත්භාවයකින් තොරව දුර්වල කොන්ක්‍රීට් මිශ්‍රණයක් යොදා නිසි ප්‍රමිතියකින් තොරව ඉදි කිරීම් කර තිබුණි. තව ද, කොන්ක්‍රීට් මාර්ග තලයේ ස්ථාන කිහිපයක් පුපුරාගොස් තිබුණි.

**3.3.4 ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම.**

-----------------------------------

සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර, ප්‍රතිපාදන වෙන් කර තිබූ එකතුව රු.740,000 ක් වූ ව්‍යාපෘති 04 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 ඝන අප ද්‍රව්‍ය කළමනාකරණය.

------------------------------------

මධ්‍යම පළාත් කෘෂිකර්ම හා පරිසර අමාත්‍යාංශය මගින් ලබා දී තිබූ ප්‍රතිපාදන රු.3,487,828 ක් වැය කර, කොම්පෝස්ට් ව්‍යාපෘතියක් 2010 වර්ෂයේ දී ආරම්භ කර තිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිරන හා නොදිරන ද්‍රව්‍ය නිසි පරිදි වර්ගීකරණය නොකර කසළ ලබා ගෙන තිබීම හා කොම්පෝස්ට් වල තුළට කසළ බැහැර කිරීමෙන් පසු විධිමත් පරිදි නොදිරන ද්‍රව්‍ය ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කසළවල පවතින ජල ප්‍රමාණය ඉවත් කිරීම සඳහා සැළසුම් කර තිබූ ටැංකිය ඒ සඳහා ප්‍රමාණවත් නොවීම හා ඒ හේතුවෙන් කොම්පෝස්ට් නිපදවීමට යොදා ගන්නා කසළවල අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා ජලය රැදී තිබීම හා දැඩි දුගඳ හමන තත්වයක් වර්ධනය වී තිබුණි.

(ඇ) මාරුවෙන් මාරුවට කසළ දිරාපත් වන ලෙසට හා පරිහරණය කළ හැකි වන පරිදි ටැංකි 02 ක් ඉදි කර තිබුණ ද, එහි ආවරණ වහළය පහතින් නිර්මාණය කර තිබීම නිසා, මිනිස් බලය යොදා දිරා ගිය කසළ සහිත ටැංකි හිස් කිරීමට දුෂ්කරතා ඇති වී තිබුණි.

(ඈ) රු.135,500 ක් වැය කර 2013 වර්ෂයේ දී හලනයක් මිල දී ගෙන තිබුණ ද, එම ස්ථානයට විදුලි සම්බන්ධතාවය ලබා ගෙන නොතිබීම හේතුවෙන්, එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(ඉ) හලනය යොදා නොගැනීම හා මිනිස් බලය යොදා කොම්පෝස්ට් පොහොර තුළ ඇති නොදිරන ද්‍රව්‍ය ඉවත් කිරීමට ඇති අපහසුව හේතුවෙන් පොහොර අළෙවි කිරීමට නොහැකි වී තිබුණි.

ඉහත කරුණු අනුව, කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය හා කසළ කළමනාකරණය නිසි පරිදි සිදු නොවීමෙන්, ඉදි කිරීම් සඳහා වැය කළ රු.3,487,828 ක මුදල නිශ්ඵල වියදමක් බවට පත් වී තිබුණි.

## 3.5 වාහන පාලනය

--------------------

සභාව සතු එක් වාහනයක 2016 මාර්තු 26 දින සිට 2016 මැයි 11 දින දක්වා කි.මී.244 ක් හා තවත් වාහනයක 2016 අප්‍රේල් 28 දින සිට 2016 මැයි 11 දින දක්වා කි.මී. 463 ක් ධාවනය කිරීමට අදාළ තොරතුරු ධාවන සටහන්වල ලියා නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.

------------------------------------

## 4.1 අයවැය පාලනය.

------------------

(අ) අවශ්‍යතාවය සළකා බලා සැළසුම් කිරීමකින් තොරව ප්‍රතිපාදන වෙන් කිරීම හේතුවෙන්, වැය විෂයන් 11 ක රු.331,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි.

(ආ) නිසි අවධානයෙන් හා සැළසුම් කිරීමකින් තොරව ආදායම් ඇස්තමේන්තු කිරීම හේතුවෙන්, ආදායම් විෂයයන් 05 ක රු.2,011,000 ක ඇස්තමේන්තුගත ආදායම් සම්පූර්ණයෙන්ම උපයා ගැනීමට නොහැකි වී තිබුණි.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.**

**-----------------------------------**

ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය.**

**--------------------------**

සභාවේ අභ්‍යන්තර විගණන නිලධාරීනියට වෙනත් විෂයය රාජකාරී පවරා තිබීම හේතුවෙන්, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට නොහැකි වී තිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය.**

**------------------------------**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

**------------------------------------------**

රු.542,508 ක් වටිනා ජල ගබඩා උපකරණ තොගයක් භාවිතයට ගැනීමකින් තොරව ගබඩාවේ රඳවා තිබුණි.

**5. පද්ධති හා පාලනය.**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) වත්කම් කළමනකරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය